# කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය
## ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය ( විශේෂ උපාධි )
## පළමු සෙමෙස්තරය -2018/2019
## SLG - 2130 - වාග්විද්‍යා ප්‍රවේශය
(පැ දෙකයි)

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න

1. වාග්විද්‍යාව නූතන භාෂාධ්‍යයන ක්‍රියාවලිය විද්‍යාත්මක මඟකට යොමු කිරීමෙහි ලා පුරෝගාමී වූ විෂය ක්ෂේත්‍රයකි. නූතන වාග්විද්‍යාව පෝෂණය කිරීමට මූලික වූ වාග්වේදීන් දෙදෙනෙකුගේ අදහස් ඇසුරින් විමසන්න.

2. භාෂාවක ශබ්ද පද්ධතිය හඳුනාගනිමෙහි ලා ශබ්දිම (Phonemes) සහ ශබ්දාණු (Allophones) යන සංකල්ප වැදගත් වන ආකාරය සනිදර්ශනව පහදන්න.

3. පදිම (Morphemes) සහ පදාණු (Allomorphs) යන සංකල්ප පැහැදිලි කොට ඒවා වර්ගීකරණය කරන ආකාරය දක්වන්න.

4. වාක්‍ය විචාරයේ මූලික සංකල්ප පැහැදිලි කොට ඒවා වාක්‍ය විචාරය කිරීමේදී භාවිත වන ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

5. "භාෂාවක අර්ථ ජනනය කිරීමේදී භාෂක සමාජයේ බලපෑමෙන් මිදීම අසීරු වේ". මෙම කියමන අර්ථ විචාරයේ (Semantics) සහ ප්‍රකරණ විචාරයේ (Pragmatics) සංකල්ප ඇසුරින් විමසන්න.

6. පහත යෙදුම් හා වාක්‍ය ජාත්‍යන්තර ශබ්ද ශික්ෂා හෝඩියේ (International Phonetic Alphapbet) සංකේත ඇසුරින් ප්‍රතිලේඛනය කරන්න.

(අ)

| | | | |
|---|---|---|---|
| i. | ආණ්ඩුව | vi. | කෘතිය |
| ii. | ක්‍රියාවලිය | vii. | ඇත්තු |
| iii. | සංඛ්‍යාව | viii. | වංකගිරිය |
| iv. | මූලධර්ම | ix. | උපාසිකාව |
| v. | හඬනවා | x. | ප්‍රවෘත්ති |

(ආ)

i. අම්මා බත් උයනවා.
ii. ක්‍රීඩිකාව තරගය ජයගන්නවා.
iii. තාත්තාට හෙට නිවාඩු.
iv. මම නාට්‍ය බලන්න ආසයි.
v. දරුවා පාසල් යනවා.

*********************